# 4

## මිල, වැටුප්, සේවා නියුක්තිය සහ ඵලදායිතාව

ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) මගින් ගණනය කරනු ලබන පොදු මිල මට්ටම, 2020 ජනවාරි මාසයේ දී ඉහළ ගිය අතර, එතැන් සිට අප්‍රේල් මාසය දක්වා අඩුවන ප්‍රවණතාවක් පෙන්නුම් කොට, ඉන් අනතුරුව ආහාර කාණ්ඩයෙහි අයිතමවල මිල විචලනවලට අනුගතව වැඩිවන ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදී. 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී, ආහාර කාණ්ඩයේ නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල මිල ගණන් මිශ්‍ර විචලන පෙන්නුම් කළ අතර, අනෙකුත් ආහාර අයිතමවල මිල ගණන් වැඩිවන ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදී. මෙම වසර ආරම්භයේ දී සැලකිය යුතු ඉහළ යෑමක් පෙන්නුම් කළ ආහාර නොවන කාණ්ඩයේ මිල ගණන්, 2020 වසරේ අප්‍රේල් සිට ජූනි දක්වා කාලපරිච්ඡේදය තුළ බොහෝ දුරට නොවෙනස්ව පැවති අතර, මේ සඳහා කොවිඩ්-19 වසංගත තත්ත්වය සමග අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ හා සේවාවන් සඳහා පැවති ඉල්ලුම අඩු වීම සහ පරිපාලිත අයිතමවල මිල ගණන් නොවෙනස්ව පවත්වා ගැනීම ප්‍රධාන වශයෙන් හේතු විය. ජා.පා.මි. දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී, මැද තනි අගය මට්ටමට ඉහළින් පැවතුණි. මේ අතර, කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද., 2013=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී එහි ඉලක්කගත පරාසය වන සියයට 4-6 තුළ බොහෝ දුරට පැවතුණි. ජා.පා.මි. දර්ශකය සහ කො.පා.මි. දර්ශකය පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය, ස්ථාවරව එහෙත් පෙර වසරට සාපේක්ෂව සැලකිය යුතු පහළ මට්ටමක පැවතුණි. මේ අතර, 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී, ව්‍යාපාර අංශයේ උද්ධමන අපේක්ෂා සැබෑ උද්ධමනයට බොහෝ සෙයින් අනුරූපව පැවතුණි. අඛණ්ඩව පවතින ව්‍යුහාත්මක ගැටලු මධ්‍යයේ කොවිඩ්-19 වසංගතයෙහි ඍණාත්මක බලපෑම් හේතුවෙන්, 2020 වසරේ පළමු භාගයේ දී ශ්‍රම වෙළඳපොළ දර්ශකවල පිරිහීමක් දක්නට ලැබුණි. ඒ අනුව, ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සහ සේවා නියුක්ත ජනගහනය, 2019 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී පහළ ගියේය. සේවා නියුක්ත ජනගහනයේ පහළ යෑමට අනුරූපව, සේවා වියුක්ති අනුපාතිකය 2019 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී සියයට 5.6ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. පෙර පැවති ප්‍රවණතාවට අනුරූපව, කාන්තාවන්, තරුණ තරුණියන් සහ ඉහළ අධ්‍යාපන සුදුසුකම්ලත් පුද්ගලයන් අතර සේවා වියුක්තිය, 2020 වසරේ පළමු භාගයේ දී ඉහළ මට්ටමක පැවතුණි. මේ අතර, කොවිඩ්-19 වසංගතය පැතිරීම හේතුවෙන්, 2019 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් සැලකිය යුතු ලෙස පහළ ගියේය.

## 2020 වසරේ ප්‍රවණතා

### මිල

#### පොදු මිල මට්ටමේ විචලන


- **2020 ජනවාරි මාසයේ දී ඉහළ ගිය පොදු මිල මට්ටම අප්‍රේල් මාසය දක්වා පහළ යන නැඹුරුවක් පෙන්නුම් කර එතැන් සිට යළි ඉහළ යන ලදී.** පොදු මිල මට්ටම මනිනු ලබන පාරිභෝගික මිල දර්ශක දෙක වන ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100),[1] 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් හා අනුරූපව විචලනය විය. කොවිඩ්-19 වසංගතය මැඩලීම සඳහා රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණවල සැලකිය යුතු බලපෑම හේතුවෙන් ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන්, 2020 වසරේ මේ දක්වා මිශ්‍ර විචලන පෙන්නුම් කරන ලදී. ජනවාරි සිට මාර්තු දක්වා කාලය තුළ දී ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් ඉහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කළ ද, රට වසා දැමුණු කාලපරිච්ඡේදයේ දී අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ හා සේවා සඳහා පැවති අඩු ඉල්ලුම පිළිබිඹු කරමින්, 2020 අප්‍රේල් සිට ජූනි දක්වා කාලය තුළ දී එම අයිතමවල මිල ගණන් පුළුල් වශයෙන් ස්ථාවර හැසිරීමක් පෙන්නුම් කරන ලදී. එසේ වුවද, 2020 ජූලි මාසයේ සිට ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් නැවතත් ඉහළ යන ලදී.

- **2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය සැලකීමේ දී නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයේ[2] අයිතමවල මිල ගණන් වසර ආරම්භයේ දී ඉහළ ගොස්, 2020 මැයි මාසය දක්වා පහළ යෑමේ නැඹුරුවක් පෙන්නුම් කර, එතැන් සිට සමස්ත ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.** 2020 ජනවාරි මාසයේ දී නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල මිලෙහි දක්නට ලැබුනු ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් එළවළු, පොල් සහ රතු ළූණුවල සිදු වූ මිල ගණන් ඉහළ යෑම් හේතු විය. එසේ වුවද, 2019 අප්‍රේල් මාසයේ සිට දක්නට ලැබුණු අඛණ්ඩ ඉහළ යෑමේ ප්‍රවණතාව වෙනස් කරමින්, නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන්, 2020 පෙබරවාරි මාසයේ සිට මැයි මාසය දක්වා පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, සහල්, එළවළු, රතු ළූණු, ලොකු මාළු, මස් සහ අමු මිරිස් යන අයිතමවල මිල ගණන්හි සිදු වූ පහළ යෑම් මේ සඳහා හේතු විය. 2020 ජූනි මාසයේ දී නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල මිලෙහි දක්නට ලැබුණු ඉහළ යෑම සඳහා සහල්, එළවළු, නැවුම් මත්ස්‍ය සහ කුකුල් මස් යන අයිතමවල සිදු වූ මිල ගණන් ඉහළ යෑම් ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, සහල්, පොල්, එළවළු සහ ළූණුවල සිදු වූ මිල ගණන් පහළ යෑම් හේතුවෙන් 2020 ජූලි මාසයේ දී මිල ගණන් ඉහළ යෑමේ ප්‍රවණතාව වෙනස් විය. නමුත්, එතැන් සිට 2020 සැප්තැම්බර් මාසය දක්වා, එළවළු, පොල්, ලොකු ළූණු සහ පලතුරුවල සිදු වූ මිල ගණන් ඉහළ යෑම් හේතුවෙන්, නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල මිල ගණන් ඉහළ යන ලදී. තෝරා ගත් නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල මිල ගණන්හි විචලන නිරීක්ෂණය කිරීමේ දී, 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී සහල් වර්ගවල මිල ගණන්හි සංශෝධන කිහිපයක් සිදු විය. කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය මර්දනය කිරීම සඳහා රට වසා දමා තිබූ කාලපරිච්ඡේදයේ දී සිදු වූ මිල ගණන් ඉහළයෑම්වලින් පාරිභෝගිකයා ආරක්ෂා කරගැනීමට මෙම මිල සංශෝධන සිදු කරන ලදී. 2020 අප්‍රේල් 10 වන දින සිට බලපැවැත්වෙන පරිදි සම්බා සහ නාඩු කිලෝග්‍රෑමයක් මත රුපියල් 90ක සහ කැකුළු සහල් කිලෝග්‍රෑමයක් මත රුපියල් 85ක උපරිම සිල්ලර මිල ගණන් පනවන ලද අතර, 2020 මැයි 28 වන දින සිට බලපැවැත්වෙන පරිදි එම මිල ගණන් නැවතත් පිළිවෙළින් රුපියල් 98, රුපියල් 96 සහ රුපියල් 93 දක්වා ඉහළ නංවන ලදී. කෙසේ වුවද, 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය අග භාගයේ දී, යල අස්වැන්න වෙළඳපොළට ලැබෙමින් පැවතිය ද සම්බා සහල්වල සැපයුමේ අඩුවක් දක්නට ලැබුණි. 2019 වසරේ පෙන්නුම් කළ මිල ප්‍රවණතාවට අනුගත නොවුණු පොල් මිල, 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදයෙහි, මැයි සහ ජූනි මාසවල හැර අනෙකුත් මාසවල දී ඉහළ ගිය අතර, පසුගිය වසරට සාපේක්ෂව ඉහළ මට්ටමක ද පැවතුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2020 සැප්තැම්බර් 25 වන දින සිට බලපැවැත්වෙන පරිදි වට ප්‍රමාණය අඟල් 12ට අඩු, අඟල් 12-13 අතර සහ අඟල් 13ට වැඩි පොල් මත පිළිවෙළින් රුපියල් 60, රුපියල් 65 සහ රුපියල් 70 යන උපරිම සිල්ලර මිල ගණන්

1 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිල පාරිභෝගික මිල දර්ශක වන ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100) මාසිකව සම්පාදනය කරනු ලබයි. ජා.පා.මි.ද. මගින් ජාතික මට්ටම නියෝජනය වන ලෙස තෝරාගත් පාරිභෝගික අයිතමවල මිල වෙනස්වීම් පෙන්නුම් කරනු ලබන අතර කො.පා.මි.ද. මගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ජනතාව නියෝජනය වන ලෙස තෝරාගත් පාරිභෝගික අයිතමවල මිල වෙනස්වීම් පෙන්නුම් කරයි.

2 සහල්, මස් වර්ග, නැවුම් මත්ස්‍ය සහ මුහුදු ආහාර, පොල්, පලතුරු, එළවළු, අර්තාපල්, ළූණු සහ තෝරාගත් කුළුබඩු වර්ග නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයට ඇතුළත් වේ.

4.1 රූප සටහන
මිල විචලන සහ ශ්‍රම වෙළඳපොළ ප්‍රවණතා



පනවන ලදී. 2020 වසරේ පෙබරවාරි, මාර්තු සහ අප්‍රේල් මාසවල ලොකු ළූණු මිල ගණන්, 2014 වසරේ සිට මේ දක්වා සියලු වසරවල අනුරූප මාසවල දී වාර්තා වූ මිල ගණන්වලට වඩා ඉහළින් පැවතුණි. මෙම ඉහළ මිල ගණන්වලින් පාරිභෝගිකයා ආරක්ෂා කර ගැනීම සඳහා 2020 පෙබරවාරි 23 වන දින සහ 2020 මාර්තු 18 වන දින සිට බලපැවැත්වෙන පරිදි පිළිවෙළින්, රුපියල් 190ක සහ රුපියල් 150ක උපරිම සිල්ලර මිල ගණන් ලොකු ළූණු කිලෝග්‍රෑමයක් මත පැනවීමට රජයට සිදු විය. පසුව, විශේෂයෙන් ලෝක වෙළඳපොළේ සිදු වූ මිල ගණන් පහළ යෑම හේතුවෙන් 2020 අප්‍රේල් සිට ජූලි දක්වා කාලය තුළ දී ලොකු ළූණු මිල ගණන් පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදී. ඉන් අනතුරුව, වගා හානි හේතුවෙන් දේශීය නිෂ්පාදනය පහළ යෑම සහ 2020 සැප්තැම්බර් 15 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉන්දියාව විසින් පනවන ලද අපනයන තහනම ප්‍රධාන වශයෙන් හේතු කොටගෙන ලොකු ළූණු මිල ගණන් ඉහළ යන ලදී. මේ අතර, ආනයනික ලොකු ළූණු කිලෝග්‍රෑමයක් මත වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2020 මැයි 01 වන දින සිට සහ 2020 අගෝස්තු 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි පිළිවෙළින්, රුපියල් 15ක් සහ රුපියල් 50ක් දක්වා ඉහළ නංවන ලදී. කෙසේ වුවද, නැවතත් රට තුළ කොවිඩ්-19 වසංගතය පැතිර යෑමේ අවදානමත් සමඟ පැන නගිමින් පවතින දුෂ්කරතා අවම කිරීමේ අරමුණින් රජය විසින් ආනයනික ලොකු ළූණු මත පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, 2020 ඔක්තෝබර් 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි ශත 25ක් දක්වා අඩු කරන ලදී. තවද, මෑත කාලීනව රතු ළූණු සඳහා වූ ඉහළම මිල මෙම වසර ආරම්භයේ දී වාර්තා වූ අතර, 2020 මැයි 22 වන දින සිට බලපැවැත්වෙන පරිදි ආනයනික රතු ළූණු කිලෝග්‍රෑමයකට රුපියල් 50ක් වශයෙන් විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉහළ දැමීම මධ්‍යයේ වුවද, 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය අවසානයේ දී රතු ළූණු මිල ගණන් සාපේක්ෂ වශයෙන් පහළ යන ලදී. 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ අර්තාපල් මිල, මෑත වසරවල අනුරූප මාස තුළ දක්නට ලැබුණු මිල මට්ටම්වලට වඩා බොහෝ දුරට ඉහළින් පැවති බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, 2020 මැයි 22 වන දින සහ 2020 අගෝස්තු 15 වන දින සිට බලපැවැත්වෙන පරිදි ආනයනික අර්තාපල් කිලෝග්‍රෑමයක් මත වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ද පිළිවෙළින්, රුපියල් 50ක් සහ රුපියල් 55ක් දක්වා ඉහළ නංවන ලදී.

- **ආහාර කාණ්ඩය තුළ නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතම හැර අනිකුත් අයිතමවල මිල ගණන්, 2020 මාර්තු මාසයේ සුළු පහළ යෑමක් පෙන්නුම් කරමින් 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදී.** ආනයනික කිරිපිටි පැකට්ටුවක මිල හා දේශීය කිරිපිටි පැකට්ටුවක මිල සමාන කිරීමේ අරමුණින්, 2020 අප්‍රේල් 28 වන දින සිට බලපැවැත්වෙන පරිදි ග්‍රෑම් 400ක දේශීය කිරිපිටි පැකැට්ටුවක මිල රුපියල් 345 සිට රුපියල් 380ක් දක්වා ඉහළ නැංවුණි. කෙසේ වුවද, 2019 වසරේ මිල සංශෝධන කිහිපයකටම බඳුන් වූ ආනයනික කිරිපිටි මිල ගණන් 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී නොවෙනස්ව පැවතුණි. කොවිඩ්-19 වෛරසය පැතිරීමත් සමඟ රටේ උද්ගත වූ තත්ත්වය තුළ පාරිභෝගිකයාට සහන සැලසීමක් වශයෙන්, 2020 මාර්තු 18 වන දින සිට බලපැවැත්වෙන පරිදි පරිප්පු කිලෝග්‍රෑමයක් රුපියල් 65ක් සහ ටින් මාළු ග්‍රෑම් 425ක් රුපියල් 100ක් වන පරිදි පැන වූ උපරිම සිල්ලර මිල ගණන්, රට වසා දැමීමේ තත්ත්වය ලිහිල් වීමත් සමඟ 2020 අප්‍රේල් 30 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කරන ලදී. පසුව, 2020 මැයි 22 වන දින සිට බලපැවැත්වෙන පරිදි පරිප්පු සහ ටින් මාළු කිලෝග්‍රෑම් එකක් මත වූ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පිළිවෙළින්, රුපියල් 10ක් සහ රුපියල් 100ක් වන පරිදි ඉහළ නංවන ලදී. රට වසා දැමූ සමයේ ක්‍රියාවට නැංවූ තවත් සහන පියවරක් ලෙස, 2020 මාර්තු 23 වන දින සිට බලපැවැත්වෙන පරිදි බිත්තරයක මිල රුපියල් 10ක් දක්වා අඩු කිරීම දැක්විය හැකි අතර, මේ හේතුවෙන් වසරේ වාර්තා වූ අවම බිත්තර මිල 2020 අප්‍රේල් මාසයේ දී වාර්තා විය. 2020 මැයි මාසයේ සිට අඛණ්ඩ ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කිරීම හේතුකොටගෙන, 2020 සැප්තැම්බර් 07 වන දින සිට බිත්තරයක මිල රුපියල් 2කින් පහළ දැමීමට තීරණය විය. බඩඉරිඟුවල කෘත්‍රිම හිඟයක් නිර්මාණය කරමින් උත්සව සමයේ කුකුල් මස් මිල ඉහළ දැමීමේ උත්සාහය මැඩලීමේ අරමුණින්, 2020 මාර්තු 12 වන දින සිට බලපැවැත්වෙන පරිදි සම සහිත බ්‍රොයිලර් කුකුල් මස් සහ සම රහිත බ්‍රොයිලර් කුකුල් මස් කිලෝග්‍රෑමයක් මත පිළිවෙළින්, රුපියල් 430ක සහ රුපියල් 500ක උපරිම සිල්ලර මිල ගණන් පනවන ලදී. ඒ අනුව, 2020 අප්‍රේල් මාසයේ දී කුකුල් මස් මිල ගණන් පහළ ගිය ද ඉන් අනතුරුව මිල ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදී.

තවද, 2020 මාර්තු 12 වන දින සිට බලපැවැත්වෙන පරිදි බඩඉරිඟු කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල ගණන් රුපියල් 55ක් දක්වා ගෙන එන ලදී. 2020 මැයි 22 වන දින සිට බලපැවැත්වෙන පරිදි තවත් ආනයනික අයිතම කිහිපයක් මත වූ විශේෂ වෙළඳ භාණ්ඩ බදු ඉහළ නැංවුණි. ඒ අනුව සීනි, යෝගට්, සුදුළූණු, වියළි මිරිස් සහ බඩඉරිඟු මත වූ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පිළිවෙළින්, කිලෝග්‍රෑමයට රුපියල් 50, රුපියල් 800, රුපියල් 50, රුපියල් 100 සහ රුපියල් 25 දක්වා ඉහළ නංවන ලදී. දේශීය කහ නිෂ්පාදනය ඉහළ නැංවීමේ අරමුණින්, 2019 දෙසැම්බර් 06 වන දින සිට බලපැවැත්වෙන පරිදි පනවන ලද ආනයනික සීමා හේතුවෙන් ඉහළ ගිය කහ කුඩු මිල පාලනය කිරීම සඳහා 2020 අප්‍රේල් 21 වන දින සිට බලපැවැත්වෙන පරිදි කහ කුඩු කිලෝග්‍රෑමයක් මත රුපියල් 750ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. මෙම උත්සාහයන් මධ්‍යයේ වුවද, දේශීය සැපයුම සහ ඉල්ලුම අතර පැවති සැලකිය යුතු පරතරය හේතුවෙන්, ඉන්පසු මාසවල දී කහ කුඩු මිල සීඝ්‍රයෙන් ඉහළ යෑම නිසා රජය විසින් 2020 සැප්තැම්බර් 24 වන දින සිට බලපැවැත්වෙන පරිදි කහ කුඩු සඳහා වූ උපරිම සිල්ලර මිල ගණන් ඉවත් කරන ලදී. මේ අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී තිරිඟු පිටි මිල ගණන් ස්ථාවර මට්ටමක පැවතුණි. රට තුළ යළි මතු වූ කොවිඩ්-19 වසංගතය පැතිරීමේ අවදානම හමුවේ ජන ජීවිතයට සිදු වූ දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් රජය මගින් පරිප්පු, ටින් මාලු සහ සීනි වැනි ආනයනික භාණ්ඩ කිහිපයක් මත පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද, 2020 ඔක්තෝබර් 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයකට ශත 25ක් දක්වා අඩු කරන ලදී.

- **වසර ආරම්භයේ දී සැලකිය යුතු ඉහළ යෑමක් පෙන්නුම් කළ ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන්, කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟ අත්‍යවශ්‍ය නොවන භාණ්ඩ හා සේවාවලට තිබූ ඉල්ලුම අවම වීමත්, ප්‍රවාහන, සන්නිවේදන, විදුලිය සහ ජල ගාස්තු ආදී පරිපාලිත මිල ගණන්හි වෙනස්කම් සිදු නොකිරීමත් හේතුවෙන් 2020 අප්‍රේල් සිට ජූනි මාසය දක්වා කාලය තුළ දී නොවෙනස්ව පැවතුණි.** 2020 අප්‍රේල් සිට ජූනි දක්වා කාලය තුළ දී මෙම අයිතමවල මිල ගණන් වෙනස් නොවීම සඳහා, 2019 වසරේ දී මෙන්ම, පාරිභෝගික මිල දර්ශක දෙකට අදාළ භාණ්ඩ පැස දෙකෙහිම විශාලතම කොටස නියෝජනය කරන නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ වෙනත් ඉන්ධන උපකාණ්ඩයේ ඇති නිවාස කුලියෙහි, 2019 වසරට සාපේක්ෂව අඩු ඉහළ යෑමක් 2020 ජනවාරි මාසයේ දී සිදු විය. මෙම ඉහළ යෑම සහ අධ්‍යාපන උපකාණ්ඩයේ ඇති ද්විතීයික අධ්‍යාපනය සඳහා වන අමතර පන්ති ගාස්තුවල සිදු වූ ඉහළ යෑම හේතුවෙන්, 2019 ජනවාරි මාසයට පසුව ආහාර නොවන කාණ්ඩයේ වාර්තා වූ වැඩිම ඉහළ යෑම 2020 ජනවාරි මාසයේ දී වාර්තා විය. තවද, 2020 මාර්තු මාසයේ දී සෞඛ්‍ය උපකාණ්ඩයේ ඇති වෛද්‍ය රසායනාගාර ගාස්තුවල ඉහළ යෑමක් සිදු විය. කෙසේ වුවද, පූර්ණ රුධිර රසායනාගාර පරීක්ෂාව (FBC) සඳහා වූ ගාස්තු පහළ යෑම හේතුවෙන්, 2020 අගෝස්තු මාසයේ දී වෛද්‍ය රසායනාගාර ගාස්තුවල අඩු වීමක් වාර්තා විය. මේ අතර, ලංකා ඉන්දියන් ඔයිල් සමාගම (LIOC) විසින් 2020 අප්‍රේල් 06 වන දින සිට ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටරයක මිල රුපියල් 142 සිට රුපියල් 137ක් දක්වා අඩු කළ ද, 2020 මැයි 17 වන දින නැවතත් එය පෙර මිල දක්වා ඉහළ නංවන ලදී. කෙසේ වුවද, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (CPC) පවත්වාගෙන ගිය මිලට සමාන වන පරිදි, ලංකා ඉන්දියන් ඔයිල් සමාගම (LIOC) ද ඔක්ටේන් 92 පෙට්‍රල් ලීටරයක මිල 2020 මැයි 20 වන දින සිට බලපැවැත්වෙන පරිදි නැවතත් රුපියල් 137 දක්වා පහළ දමන ලදී. අරක්කු, බියර් සහ සිගරට් මිල ගණන් වසරේ මේ වන තෙක් නොවෙනස්ව පැවතුණ ද, පුවක් සහ බුලත් මිල ගණන් 2020 අගෝස්තු මාසයේ සිට සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී. මේ අතර, 2020 ජූලි මාසයේ සිට ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.


## පාරිභෝගික මිල දර්ශක

### ජාතික පාරිභෝගික මිල දර්ශකය

- **2020 ජනවාරි මාසයේ දී දර්ශකාංක 137.0ක් ලෙස වාර්තා වූ ජා.පා.මි.ද., අප්‍රේල් මාසයේ දී දර්ශකාංක 134.8ක් දක්වා පහළ ගොස්, 2020 සැප්තැම්බර් මාසයේ දී දර්ශකාංක 138.9ක් ලෙස වාර්තා විය.** 2020 ජනවාරි මාසයේ දී ජා.පා.මි.ද. හි දක්නට ලැබුණු ඉහළ යෑම සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිලෙහි සිදු වූ ඉහළ යෑම් දායක විය. ඉන් අනතුරුව, ආහාර කාණ්ඩයේ අයිතමවල මිලෙහි සිදු වූ පහළ යෑම හේතුවෙන්, 2020 මාර්තු සහ අප්‍රේල් යන මාස දෙක තුළ දී ජා.පා.මි.ද. අඛණ්ඩව පහළ යන ලදී. පෙර පෙන්නුම් කළ පහළ යන නැඹුරුවෙන් අපගමනයක් පෙන්නුම් කළ

4

**4.2 රූප සටහන**
**මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය ජා.පා.මි.ද. (2013=100)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ජා.පා.මි.ද., ඉන් පසුව 2020 ජූනි මාසය දක්වා ඉහළ ගිය අතර, ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් මෙම ඉහළ යන ගමන්‍යතාව සඳහා පූර්ණ දායකත්වය සපයන ලදී. එසේ වුවද, ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන්හි සිදු වූ පහළ යෑම, ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන්හි දක්නට ලැබුණු ඉහළ යෑම මගින් අහෝසි වී යෑම හේතුවෙන්, ජා.පා.මි.ද., 2020 පෙබරවාරි සහ ජූලි මාසවල දී නොවෙනස්ව පැවතුණි. තවද, 2020 අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දී ජා.පා.මි.ද. හි දක්නට ලැබුණු ඉහළ යෑම සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන්හි සිදු වූ ඉහළ යෑම් දායක විය.

## කොළඹ පාරිභෝගික මිල දර්ශකය

- **2020 ජනවාරි මාසයේ දී, කො.පා.මි.ද., දර්ශකාංක 134.6ක් වාර්තා කළ අතර, 2020 මාර්තු මාසයේ දී දර්ශකාංක 133.4ක් දක්වා පහළ ගොස්, 2020 සැප්තැම්බර් මාසයේ දී දර්ශකාංක 136.3ක් දක්වා ඉහළ යන ලදී.** ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන්හි සිදු වූ විචලන හේතුවෙන් කො.පා.මි.ද., 2020 ජනවාරි මාසයේ දී ඉහළ ගියේය. මේ අතර, 2020 මාර්තු මාසයේ දී සිදු වූ පහළ යෑමට මෙන්ම අප්‍රේල් මාසයේ දී සිදු වූ ඉහළ යෑමට ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන්හි සිදු වූ විචලන හේතු විය. 2020 ජූලි මාසය දක්වා වූ මාස තුන තුළ දී සහ 2020 සැප්තැම්බර් මාසයේ දී කො.පා.මි.ද. පෙන්නුම් කළ මාසික ඉහළ යෑම් සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල සිදු වූ මිල ඉහළ යෑම් ප්‍රධාන වශයෙන් හේතු විය.

## මතුපිට උද්ධමනය

- **2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය මැදි තනි අගය මට්ටමට ඉහළින් පැවතුණි.** 2020 ජනවාරි මාසයේ දී සියයට 7.6ක් ලෙස වාර්තා වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, පෙබරවාරි මාසයේ දී, 2017 නොවැම්බර් මාසයට පසු වාර්තා වූ ඉහළම අගය වන සියයට 8.1ක් දක්වා ඉහළ ගොස්, 2020 සැප්තැම්බර් මාසයේ දී සියයට 6.4ක් ලෙස වාර්තා විය. මේ අතර, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය, 2020 ජනවාරි මාසයේ වාර්තා වූ සියයට 4.1 සිට 2020 සැප්තැම්බර් මාසයේ වාර්තා වූ සියයට 6.2ක් දක්වා අඛණ්ඩව ඉහළ යන ලදී.

- **2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය, සියයට 4.0ත් සියයට 6.0ත් අතර ඉලක්කගත පරාසය තුළ බොහෝ දුරට පැවතුණි.** ඒ අනුව, කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය, ජනවාරි මාසයේ වාර්තා වූ සියයට 5.7 සිට 2020 පෙබරවාරි මාසයේ දී සියයට 6.2ක් දක්වා ඉහළ ගොස්, එතැන් සිට පහළ යන නැඹුරුවක ගමන් කර ජූනි මාසයේ දී සියයට 3.9ක් වූ අතර, ඉන් අනතුරුව ඉහළ යමින්, 2020 සැප්තැම්බර් මාසයේ දී සියයට 4.0 දක්වා ඉහළ ගියේය. මේ අතර, කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය උද්ධමනය, 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර්

**4.3 රූප සටහන**
**මතුපිට උද්ධමනයේ විචලන ජා.පා.මි.ද. (2013=100)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී ස්ථාවර මට්ටමක පැවතුණු අතර, එය 2020 ජනවාරි මාසයේ දී සියයට 4.5ක් ලෙසත් 2020 සැප්තැම්බර් මාසයේ දී සියයට 4.7ක් ලෙසත් වාර්තා විය.

## මූලික උද්ධමනය

- **වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මනිනු ලබන මූලික උද්ධමනය, ස්ථාවර එහෙත් පෙර වසරට වඩා සැලකිය යුතු ලෙස අවම අගයන්හි පැවති අතර, 2019 වසර ආරම්භයේ දී නිවාස කුලියෙහි දක්නට ලැබුණු සැලකිය යුතු ඉහළ යෑම තුළින් හටගත් ඉහළ පදනම් අගය මගින් ඇති වූ සංඛ්‍යානමය බලපෑම පෙර වසර පුරා පැවතීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.** 2020 ජනවාරි මාසයේ දී ද නිවාස කුලියෙහි ඉහළ යෑමක් දක්නට ලැබුණ ද එහි බලපෑම, 2019 වසරට සාපේක්ෂව අවම මට්ටමක පැවතුණි. ඒ අනුව, මෙම වසරේ සිදු වූ මාසික ඉහළ යෑම් මධ්‍යයේ, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය, 2020 ජනවාරි මාසයේ වාර්තා වූ සියයට 3.9 සිට මාර්තු මාසයේ වාර්තා වූ සියයට 3.2 දක්වා පහළ යන නැඹුරුවක ගමන් කර, අප්‍රේල් මාසයේ දී නොවෙනස්ව පැවති අතර, 2020 සැප්තැම්බර් මාසයේ වාර්තා වූ සියයට 4.8ක් දක්වා අඛණ්ඩව ඉහළ යන ලදී. මේ අතර, කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය, 2020 ජනවාරි මාසයේ දී සියයට 3.0ක් සහ 2020 සැප්තැම්බර් මාසයේ දී සියයට 2.9ක් ලෙස වාර්තා විය.

## නිෂ්පාදක මිල උද්ධමනය

- **නිෂ්පාදකයාගේ මිල දර්ශකයේ (නි.මි.ද., 2013 සිව්වන කාර්තුව=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන නිෂ්පාදක මිල උද්ධමනය, 2020 ජනවාරි මාසයේ දී සියයට 5.6ක් දක්වා ඉහළ ගොස්, මෙම වසරේ පෙන්නුම් කළ ඉහළතම අගය වූ සියයට 7.8 ජූලි මාසයේ දී වාර්තා කරමින්, 2020 අගෝස්තු මාසයේ දී සියයට 7.7ක් දක්වා පහළ යන ලදී.** කෘෂිකර්මාන්ත, නිෂ්පාදන, විදුලිය හා ජල සැපයුම යන උපඅංශ තුනෙහිම වාර්ෂික ලක්ෂ්‍යමය නිෂ්පාදක මිල උද්ධමනය 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී සැලකිය යුතු ලෙස විචලනය වෙමින් සමස්ත වශයෙන් ඉහළ යෑමක් පෙන්නුම් කරන ලදී.


## උද්ධමන අපේක්ෂා

- **ව්‍යාපාර අංශයෙහි උද්ධමන අපේක්ෂා, 2020 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී මිශ්‍ර විචලන පෙන්නුම් කරමින් සියයට 4-6 පරාසයෙහි බොහෝ දුරට පැවතුණු අතර, කුටුම්බ අංශයෙහි උද්ධමන අපේක්ෂා, ව්‍යාපාර අංශයෙහි උද්ධමන අපේක්ෂාවලට වඩා ඉහළ මට්ටමක පැවතුණි.** ව්‍යාපාර සහ කුටුම්බ යන අංශ දෙකෙහිම කෙටි කාලීන උද්ධමන අපේක්ෂා ඔවුන්ගේ දිගු කාලීන උද්ධමන අපේක්ෂාවලට වඩා ඉහළ මට්ටමක පැවතුණි. ඒ අනුව, කොවිඩ්-19 වසංගතය පැතිරීම පාලනය කිරීමට ගන්නා ලද සීමා කිරීමේ ක්‍රියාමාර්ග සමග දේශීය නිෂ්පාදනයට සහ සැපයුම් ජාලවලට ඇති වූ

4

**4.4 රූප සටහන**


**නිෂ්පාදක මිල උද්ධමනයෙහි විචලන (වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශතය)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**4.5 රූප සටහන**

**ව්‍යාපාරික අංශයේ උද්ධමන අපේක්ෂා**




මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

බාධක, රජය විසින් පනවන ලද ආනයන සීමා, දේශීය මුදල අවප්‍රමාණය වීම, ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ කොවිඩ්-19 වසංගත තත්ත්වය හා බැඳුණු සීමා ලිහිල් වීමත් සමඟ ඉල්ලුමෙහි සහ ආර්ථික ක්‍රියාකාරකම්වල යථා තත්ත්වයට පත්වීමක් අපේක්ෂා කිරීම ඔවුන්ගේ ඉහළ උද්ධමන අපේක්ෂාවලට ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, කොවිඩ්-19 වසංගතය පැතිර යෑම මධ්‍යයේ ඉල්ලුම සහ ආර්ථික ක්‍රියාකාරකම් පහළ යෑම සහ ජාත්‍යන්තර ඉන්ධන මිල ගණන් පහළ යෑම, ගෙවතු වගාව ඉහළ යෑම, දේශීය නිෂ්පාදනයෙහි අපේක්ෂිත වර්ධනය, ආනයන සීමා ලිහිල් කිරීම පිළිබඳ අපේක්ෂා සහ කොවිඩ්-19 වසංගත තත්ත්වය හා බැඳුණු සීමා ලිහිල් වීමත් සමඟ සැපයුම් ජාල යථා තත්ත්වයට පත්වීම දිගුකාලීන උද්ධමන අපේක්ෂා පහළ මට්ටමක පැවතීමට හේතු ලෙස ප්‍රතිචාර දක්වන්නන් විසින් සඳහන් කරන ලදී.

## වැටුප්


4

- **රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) මගින් මනිනු ලබන රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, 2019 ජනවාරි සිට අගෝස්තු දක්වා වූ කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී, 2020 වසරේ එම කාලපරිච්ඡේදය තුළ දී සියයට 11.1කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.** 2019 ජූලි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම වැටුප් ගණනය කිරීමේ දී සලකා නොබලන රුපියල් 2,500 නව අන්තර් අතුරු දීමනාවක් සියලු රාජ්‍ය සේවකයන්ට ලබාදීම සහ විශේෂ දීමනාවෙහි හා අන්තර් අතුරු දීමනාවෙහි අවසන් කොටස 2020 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය අංශයේ සේවකයින්ගේ මූලික වැටුපට එකතු කිරීම මෙම ඉහළ යෑම සඳහා හේතු විය. ඒ අනුව, රාජ්‍ය අංශයේ සේවකයින්ගේ මූර්ත වැටුප් ද 2019 ජනවාරි සිට අගෝස්තු දක්වා වූ කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී සියයට 4.3කින් ඉහළ යන ලදී.

- **පඩිපාලක සභා මගින් වැටුප් පාලනය වන සේවකයින්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර්=100) මගින් මනිනු ලබන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයින්ගේ නාමික වැටුප්, 2019 ජනවාරි සිට අගෝස්තු දක්වා වූ කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී, 2020 වසරේ එම කාලපරිච්ඡේදය තුළ දී සියයට 0.2කින් සුළු වශයෙන් ඉහළ ගියේය.** කෙසේ වුවද, විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප්, 2019 ජනවාරි සිට අගෝස්තු දක්වා වූ කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී,

**4.6 රූප සටහන**

**මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකවල වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම**




මූලයන්: කම්කරු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී සියයට 4.4කින් පහළ යන ලදී. මේ අතර, වතු අංශයෙහි සේවකයින්ගේ මූලික දෛනික වැටුප රුපියල් 1,000ක් දක්වා ඉහළ දැමීමට ඇති හැකියාව සොයා බැලීමට 2020 වසරේ දී සාකච්ඡා වට කිහිපයක් පැවැත්විණි.

- **අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2012=100) මගින් මනිනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, 2019 ජනවාරි සිට අගෝස්තු දක්වා වූ කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී, 2020 වසරේ එම කාලපරිච්ඡේදය තුළ දී, සියයට 3.5කින් ඉහළ ගියේය.** 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී, කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා යන සියලුම උපඅංශවල සේවකයන්ගේ නාමික වැටුප් පිළිවෙළින්, සියයට 4.1කින්, සියයට 2.9කින් සහ සියයට 3.9කින් ඉහළ යන ලදී. කෙසේ වුවද, අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයින්ගේ මූර්ත වැටුප් 2019 ජනවාරි සිට අගෝස්තු දක්වා වූ කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී සියයට 2.8කින් පහළ යන ලදී.

## ශ්‍රම බලකාය, සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය

- **අඛණ්ඩව පවතින ව්‍යුහාත්මක ගැටලු මධ්‍යයේ ඇති වූ කොවිඩ්-19 වසංගතයෙහි සෘණාත්මක බලපෑම් හේතුවෙන් 2020 වසරේ පළමු භාගය තුළ දී ශ්‍රම වෙළඳපොළ දර්ශක පිරිහීමකට ලක් විය.** ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරන ලද සංඛ්‍යානවලට අනුව, 2019 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනයෙහි

**4.1 සංඛ්‍යා සටහන**
**ශ්‍රම බලකාය, සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය**

| අයිතමය | 2019 | | 2020 (අ) | |
|---|---|---|---|---|
| | පළමු භාගය | වාර්ෂික | පළමු භාගය | වාර්ෂික (පුරෝකථන) |
| කුටුම්බ ජනගහනය, '000 (වයස අවුරුදු 15 සහ ඉහළ) | 16,364 | 16,424 | 16,742 | 16,781 |
| ශ්‍රම බලකාය, '000 | 8,603 | 8,592 | 8,470 | 8,540 |
| සේවා නියුක්ත, '000 | 8,193 | 8,181 | 7,998 | 8,089 |
| සේවා වියුක්ත, '000 | 410 | 411 | 471 | 451 |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස) | 52.6 | 52.3 | 50.6 | 50.9 |
| සේවා වියුක්ති අනුපාතිකය (ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස) | 4.8 | 4.8 | 5.6 | 5.3 |

(අ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සැලකිය යුතු ඉහළ යෑමට සාපේක්ෂව ආර්ථික වශයෙන් සක්‍රිය ජනගහනයෙහි සිදු වූ අඩු පහළ යෑම හේතුවෙන්, වැඩ කරන වයසේ ජනගහනය ඉහළ යන ලදී. ඒ අනුව, ශ්‍රම බලකාය සහ වැඩ කරන වයසේ ජනගහනය අතර අනුපාතය වන ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 2019 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2020 වසරේ එම කාලපරිච්ඡේදය තුළ දී පහළ යන ලදී. සේවා නියුක්ත ජනගහනයෙහි ද සැලකිය යුතු පහළ යෑමක් දක්නට ලැබුණි. සේවා වියුක්ත ජනගහනය ශ්‍රම බලකායෙහි ප්‍රතිශතයක් ලෙස ගණනය කරනු ලබන සේවා වියුක්ති අනුපාතිකය, 2019 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී. මෑත කාලීනව දක්නට ලැබුණු ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින් කාන්තාවන්, තරුණ තරුණියන් සහ ඉහළ අධ්‍යාපන සුදුසුකම්ලත් පුද්ගලයන් අතර සේවා වියුක්ති අනුපාතිකය 2020 වසරේ පළමු භාගය තුළ දී ද ඉහළ මට්ටමක පැවතුණි.

## ශ්‍රම බලකාය

- **ආර්ථික වශයෙන් සක්‍රිය ජනගහනය[3] වන ශ්‍රම බලකාය, 2019 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ මිලියන 8.603 සිට 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී මිලියන 8.470ක් දක්වා සියයට 1.5කින් පහළ යන ලදී.** ශ්‍රම බලකායේ මෙම පහළ යෑම සඳහා සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී ස්ත්‍රී ශ්‍රම බලකායේ සියයට 6.0ක කැපී පෙනෙන පහළ යෑම හේතු විය. කෙසේ වුවද, ශ්‍රම බලකායේ වැඩිම කොටසට හිමිකම් කියන පුරුෂ ශ්‍රම බලකාය, 2019 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2020 වසරේ පළමු භාගයේ දී සියයට 0.9කින් ඉහළ යන ලදී. අංශ අනුව ශ්‍රම බලකාය සැලකූ විට, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී සියලුම අංශවල එනම් නාගරික, වතු සහ ග්‍රාමීය අංශවල පහළ යෑමක් දක්නට ලැබුණු අතර, ස්ත්‍රී ශ්‍රම බලකායේ සැලකිය යුතු පහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, නාගරික සහ වතු අංශවල පුරුෂ ශ්‍රම බලකායේ ද සුළු වශයෙන් පහළ යෑමක් වාර්තා වුව ද, ග්‍රාමීය අංශයේ පුරුෂ ශ්‍රම බලකායේ ඉහළ යෑමක් වාර්තා විය.

- **ශ්‍රම බලකායේ පහළ යෑමට සමගාමීව, ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය, 2019 වසරේ පළමු භාගය තුළ වාර්තා වූ සියයට 52.6 සිට 2020 වසරේ පළමු භාගයේ දී සියයට 50.6ක් දක්වා පහළ යන ලදී.** මෙම සැලකිය යුතු පහළ යෑමට ප්‍රධාන වශයෙන්ම සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ ආර්ථික වශයෙන් සක්‍රිය නොවන ස්ත්‍රීන් කැපී පෙනෙන ලෙස ඉහළ යෑම හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 2019 වසරේ පළමු භාගය තුළ පැවති සියයට 34.7 සිට 2020 වසරේ පළමු භාගයේ දී සියයට 32.0ක් දක්වා පහළ යන ලදී. ආර්ථික වශයෙන් සක්‍රිය පුරුෂයන්ගේ ඉහළ යෑමට සාපේක්ෂව ආර්ථික වශයෙන් සක්‍රිය නොවන පුරුෂයන්ගේ ඉහළ යෑම ප්‍රමාණාත්මකව විශාල වීම හේතුවෙන් පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය ද, 2019 වසරේ පළමු භාගයේ දී පැවති සියයට 73.4 සිට 2020 පළමු භාගයේ දී සියයට 72.1ක් දක්වා පහළ යන ලදී. ඒ අනුව, රටේ ආර්ථික වර්ධනය කෙරෙහි, අඩු ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්වය සම්බන්ධයෙන් අඛණ්ඩව පවතින ගැටලු තහවුරු කරමින්, ස්ත්‍රී හා පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතික අතර පරතරය 2019 වසරේ පළමු භාගයේ වාර්තා වූ සියයට 38.7 සිට 2020 වසරේ පළමු භාගයේ දී සියයට 40.1ක් දක්වා ඉහළ යන ලදී.

3 ආර්ථික වශයෙන් සක්‍රිය ජනගහනය, එනම් සලකා බලනු ලබන සතියක කාලසීමාව තුළ වයස අවුරුදු 15 සහ ඊට වැඩි සේවා නියුක්ත හෝ සේවා වියුක්ත ජනගහනය

4

## සේවා නියුක්තිය

- **සේවා නියුක්ත ජනගහනය,[4] 2019 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ මිලියන 8.193ට සාපේක්ෂව, 2020 වසරේ පළමු භාගයේ දී මිලියන 7.998ක් දක්වා සියයට 2.4කින් පහළ යන ලදී.** මෙම පහළ යෑමට කර්මාන්ත සහ සේවා යන අංශ දෙකම හේතු වූ අතර, කෘෂිකර්මාන්ත අංශයේ සේවා නියුක්ත ජනගහනයෙහි ඉහළ යෑමක් දක්නට ලැබුණි. කර්මාන්ත අංශය තුළ පතල් හා කැණීම්, නිෂ්පාදන හා ඉදිකිරීම්, විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායු සමීකරණ සැපයුම, ජලය එක්රැස් කිරීම, අපද්‍රව්‍ය බැහැර කිරීම, ප්‍රතිකාරක යෙදීම සහ සැපයීම යන සියලු උපඅංශවල සේවා නියුක්ත ජනගහනයෙහි පහළ යෑමක් දක්නට ලැබුණු අතර, සේවා අංශය තුළ තොග සහ සිල්ලර වෙළඳාම, මෝටර් වාහන හා යතුරුපැදි අලුත්වැඩියා කිරීම, පරිපාලනමය සහ සහාය සේවා කටයුතු සහ රාජ්‍ය පරිපාලන සහ ආරක්ෂණය, අත්‍යවශ්‍ය සමාජ ආරක්ෂණය යන උපඅංශවල සේවා නියුක්ත ජනගහනයෙහි කැපී පෙනෙන පහළ යෑම් දක්නට ලැබුණි. කර්මාන්ත සහ සේවා අංශවල සේවා නියුක්තියේ මෙම පහළ යෑම, 2020 වසරේ පළමු භාගයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලැබූ නිෂ්පාදන සහ සේවා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණවල සේවා නියුක්ති උපදර්ශකවලින් ද පිළිබිඹු විය. එමෙන්ම, මෑත කාලීනව දක්නට ලැබුණු ප්‍රවණතාවට අනුරූපව, 2020 වසරේ පළමු භාගයේ දී සමස්ත සේවා නියුක්තියෙන් සියයට 46.2ක් වූ සේවා අංශය, ප්‍රමුඛතම රැකියා උත්පාදක අංශය වූ අතර, කර්මාන්ත සහ කෘෂිකර්මාන්ත අංශ පිළිවෙළින් සේවා නියුක්තියට සියයට 27.0ක සහ සියයට 26.8ක දායකත්වයක් ලබා දෙන ලදී.

- **සේවා නියුක්ති තත්ත්වය අනුව, 2019 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2020 වසරේ පළමු භාගය තුළ සියලු කාණ්ඩවල සේවා නියුක්ත ජනගහනය පහළ යන ලදී.** සේවා නියුක්ති තත්ත්වය අනුව, සේවා නියුක්ත ජනගහනය ප්‍රධාන කාණ්ඩ දෙකකට, එනම් වැටුප් ලබන සේවකයන් සහ ස්වයං රැකියාවල නියුතු වූවන් ලෙස වර්ගීකරණය කර ඇත. වැටුප් ලබන සේවකයන්ගේ කාණ්ඩය තවදුරටත් රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය ලෙස වර්ගීකරණය කර ඇති අතර, ස්වයං රැකියාවල නියුතු වූවන්ගේ කාණ්ඩය, සේව්‍යයන්, තමාගේම වැඩ කටයුතු කරන්නන් සහ ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන් ලෙස වර්ගීකරණය කර ඇත. මෙම කාණ්ඩ අතර, පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මෙන්ම රාජ්‍ය අංශයේ සේවකයන්ගේ ද කැපී පෙනෙන පහළ යෑමක් දක්නට ලැබුණි. එසේ වුවද, රැකියා විරහිත උපාධිධාරීන් 60,000කට සහ "සෞභාග්‍යයේ දැක්ම" ලෙස නම් කර ඇති රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව දිළිඳුකම තුරන් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ අඩු ආදායම්ලාභීන් 100,000කට රැකියා ලබා දීමේ රජයේ වැඩපිළිවෙළ සමඟ මෙම වසරේ දෙවන භාගයේ දී රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.

## සේවා වියුක්තිය

- **කොවිඩ්-19 වසංගතයේ ඍණාත්මක බලපෑම් හේතුවෙන් සිදු වූ සේවා නියුක්ත ජනගහනයේ පහළ යෑමට සමගාමීව, සේවා වියුක්ත ජනගහනය 2019 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ මිලියන 0.410ට සාපේක්ෂව 2020 වසරේ පළමු භාගයේ දී මිලියන 0.471ක් දක්වා සියයට 14.8කින් සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී.** සේවා වියුක්ත ජනගහනයේ මෙම ඉහළ යෑමට, සේවා වියුක්ත ජනගහනයෙහි සමස්ත වැඩිවීමෙන් සියයට 58කට ආයක වූ ස්ත්‍රී සේවා වියුක්ත ජනගහනය ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, සලකා බලන කාලපරිච්ඡේදය තුළ ස්ත්‍රී සේවා වියුක්ත ජනගහනයෙහි ඉහළ යෑම සියයට 16.0ක් ලෙස වාර්තා වූ අතර, පුරුෂ සේවා වියුක්ත ජනගහනයෙහි ඉහළ යෑම සියයට 13.4ක් ලෙස වාර්තා විය.

- **සේවා වියුක්ත ජනගහනයේ[5] ඉහළ යෑමට සමගාමීව, සේවා වියුක්ති අනුපාතිකය 2019 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 4.8 සිට 2020 වසරේ පළමු භාගයේ දී සියයට 5.6ක් දක්වා ඉහළ යන ලදී.** ඒ අනුව, ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතිකය 2019 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 7.2 සිට 2020 වසරේ පළමු භාගයේ දී සියයට 8.9ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී. පුරුෂ සේවා වියුක්ති අනුපාතිකය 2019 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 3.4 සිට 2020 වසරේ පළමු භාගයේ දී සියයට 3.9ක් දක්වා ඉහළ යන ලදී.

---

4 අදාළ යොමු කාලය තුළ සේවකයන්, සේව්‍යයන්, තමාගේම වැඩකටයුතු කරන්නන් හෝ ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන් ලෙස අවම වශයෙන් පැයක්වත් ආර්ථික කටයුත්තක යෙදුන පුද්ගලයන් සේවා නියුක්ත පුද්ගලයන් ලෙස හඳුන්වනු ලබයි. මෙයට අදාළ යොමු කාලය තුළ ආර්ථික කටයුත්තක යෙදී නොසිටියත් එම ආර්ථික කටයුත්ත සමඟ විධිමත් බැඳීමක් ඇති පුද්ගලයන් ද අයත් වේ.

5 රැකියාවක් සොයන හා රැකියාවක් නොකළ සහ පසුගිය සති හතරක කාලය තුළ රැකියාවක් සෙවීමට යම් පියවරක් ගත් හා ඉදිරි සති දෙක තුළ රැකියාවක් ලැබුණහොත් භාර ගැනීමට හැකියාවක් ඇති පුද්ගලයන් සේවා වියුක්ත පුද්ගලයන් ලෙස හඳුන්වනු ලබයි.

**4.2 සංඛ්‍යා සටහන**

**සේවා වියුක්ති අනුපාතිකය (%) - 2020 වසරේ පළමු භාගය (අ)**

| වයස අනුව (අවුරුදු) | |
|---|---|
| 15-19 | 31.0 |
| 20-24 | 26.3 |
| 25-29 | 11.3 |
| 30-39 | 3.2 |
| 40 හා ඉන් ඉහළ | 1.2 |
| **අධ්‍යාපන මට්ටම අනුව** | |
| 6-10 ශ්‍රේණි | 4.0 |
| අ.පො.ස. (සා.පෙළ) | 7.0 |
| අ.පො.ස. (උ.පෙළ) හා ඉන් ඉහළ | 10.1 |

(අ) තාවකාලික


මූලයː ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

- **සියලුම වයස් කාණ්ඩවල සේවා වියුක්ති අනුපාතික 2019 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2020 වසරේ පළමු භාගයේ දී ඉහළ යන ලදී.** මෙම වයස් කාණ්ඩ අතර තරුණ (අවුරුදු 15-24) කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතිකය 2019 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 20.8 සිට 2020 වසරේ පළමු භාගයේ දී සියයට 27.3ක් දක්වා සැලකිය යුතු වැඩිවීමක් වාර්තා කරමින් අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතුණි. තවද, සේවා වියුක්ත ජනගහනයේ සමස්ත වැඩිවීමෙන් සියයට 98ක් සඳහා සේවා වියුක්ත තරුණ තරුණියන් දායක විය. තරුණ ශ්‍රම බලකායෙන් හතරෙන් එකකට වඩා වැඩි ප්‍රමාණයක් සේවා වියුක්තිකයන් වීම තුළින්, රටේ ආර්ථික වර්ධනය සඳහා වඩාත් ඵලදායි වන මානව ප්‍රාග්ධනය නිසි පරිදි උපයෝගී කර නොගැනීම සම්බන්ධව ඇති ගැටලු පෙන්නුම් කරයි.

- **අධ්‍යාපන මට්ටම් අනුව සලකා බැලීමේ දී, සියලු අධ්‍යාපන කාණ්ඩවල සේවා වියුක්ති අනුපාතික 2019 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2020 වසරේ පළමු භාගය තුළ දී ඉහළ යන ලදී.** අ.පො.ස. (උ.පෙළ) හා ඉන් ඉහළ අධ්‍යාපන සුදුසුකම්ලත් කාණ්ඩයෙන් අඛණ්ඩව ඉහළම සේවා වියුක්ති අනුපාතිකය වාර්තා විය. ඒ අනුව, මෙම කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතිකය 2019 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ සියයට 8.7 සිට 2020 වසරේ පළමු භාගයේ දී සියයට 10.1ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී. තවද, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී සේවා වියුක්ත ජනගහනයේ සමස්ත ඉහළ යෑමෙන් සියයට 40ක් සඳහා අ.පො.ස. (උ.පෙළ) හා ඉන් ඉහළ අධ්‍යාපන සුදුසුකම්ලත් කාණ්ඩය දායක වී ඇත. ඉහළ අධ්‍යාපන සුදුසුකම්ලත් පුද්ගලයන් අතර ඇති මෙම ඉහළ සේවා වියුක්තිය රටේ අධ්‍යාපන ක්‍රමයේ පවතින අඩුපාඩු හේතුවෙන් ඇති වී තිබෙන ශ්‍රම ඉල්ලුම හා සැපයුම අතර ඇති නොගැලපීම පිළිබිඹු කරයි. මේ අතර, 6-10 ශ්‍රේණි දක්වා අධ්‍යාපන සුදුසුකම්ලත් කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතිකය 2019 වසරේ පළමු භාගය තුළ දී වාර්තා වූ සියයට 3.0 සිට 2020 වසරේ පළමු භාගය තුළ දී සියයට 4.0ක් දක්වා ඉහළ ගිය අතර, අ.පො.ස. (සා.පෙළ) සමත් කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතිකය 2019 වසරේ පළමු භාගය තුළ දී වාර්තා වූ සියයට 6.3 සිට 2020 වසරේ පළමු භාගය තුළ දී සියයට 7.0ක් දක්වා ඉහළ යන ලදී. සියලුම අධ්‍යාපන මට්ටම්වල ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතික පුරුෂ සේවා වියුක්ති අනුපාතිකවලට වඩා ඉහළ මට්ටමක පැවතුණ ද, එය අ.පො.ස. (උ.පෙළ) හා ඉන් ඉහළ කාණ්ඩයේ කැපී පෙනෙන ලෙස ඉහළ මට්ටමක පැවතීම ඉහළ අධ්‍යාපන සුදුසුකම්ලත් කාන්තාවන් අතර පවතින සේවා නියුක්තිය පිළිබඳ ගැටලු පිළිබිඹු කරයි.

**4.7 රූප සටහන**

**සමස්ත සේවා වියුක්ති අනුපාතිකය**




මූලයː ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව


## විදේශ සේවා නියුක්තිය

- **කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ලියාපදිංචි කරන ලද සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ පිටත්ව යෑම් සඳහා පැන වූ තාවකාලික තහනම සහ මෙරට ශ්‍රමය ලබා ගන්නා රටවල් විසින් පැන වූ සංචරණ සීමාවන් සමඟ, විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්, 2019 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ 95,007 සිට 2020 වසරේ පළමු භාගයේ දී 40,689ක් දක්වා සියයට 57.2කින් තියුණු ලෙස පහළ යන ලදී.** ඒ අනුව, 2020 වසරේ පළමු භාගය තුළ විදේශ රැකියා සඳහා පිටත් වූ මුළු සංඛ්‍යාවෙන් සියයට 60ක් පුරුෂයන් ද, සියයට 40ක් කාන්තාවන් ද විය. එමෙන්ම, 2019 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2020 වසරේ පළමු භාගයේ දී පුරුෂ සහ කාන්තා විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් පිළිවෙළින් සියයට 56.6කින් සහ

4

**4.8 රූප සටහන**

**කුසලතා මට්ටම අනුව විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් (වසරේ පළමු භාගය තුළ)**




මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය



සියයට 58.0කින් පහළ යන ලදී. මේ අතර, විදේශ රැකියා සඳහා වන මුළු පිටත්ව යෑම්වල පහත වැටීමට සමගාමීව, වෘත්තීය, මධ්‍යම, ලිපිකරු හා ඒ ආශ්‍රිත, පුහුණු, අර්ධ පුහුණු, නුපුහුණු සහ ගෘහ සේවිකා යන සියලු නිපුණතා කාණ්ඩ යටතේ පිටත්ව යෑම් 2019 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2020 වසරේ පළමු භාගයේ දී පහළ යන ලදී. කෙසේ වුවද, නුපුහුණු සහ ගෘහ සේවිකා කාණ්ඩ 2020 වසරේ පළමු භාගයේ දී විදේශ රැකියා සඳහා මුළු පිටත්ව යෑම්වලින් සියයට 56ක බහුතරයක් නියෝජනය කරන ලදී. ඒ අනුව, 2020 වසරේ පළමු භාගය තුළ නුපුහුණු සහ ගෘහ සේවිකා කාණ්ඩ යටතේ පිටත්ව යෑම් පිළිවෙළින් 10,686ක් සහ 12,163ක් විය.

- **කොවිඩ්-19 වසංගතය හේතුවෙන් දැඩි ලෙස පීඩාවට පත් වූ කාණ්ඩ අතර සංක්‍රමණික ශ්‍රමිකයන් ද වේ.** වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස මාර්තු මස මුල දී ඉතාලිය, දකුණු කොරියාව සහ අනෙකුත් යුරෝපීය රටවලින් සංක්‍රමණික ශ්‍රමිකයන් විශාල සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවට නැවත පැමිණෙන ලදී. මෙරටට මඟින් පැමිණීම අත්හිට වූ දින සිට සෞඛ්‍ය අවදානම්, කොන්ත්‍රාත් කල් ඉකුත්වීම් සහ වසංගතය හේතුවෙන් ඇති වූ ආර්ථික පසුබෑමේ ප්‍රතිඵලයක් ලෙස සිදු වූ රැකියා අහිමිවීම් සහ වැටුප් කප්පාදු මධ්‍යයේ සංක්‍රමණික ශ්‍රමිකයන් සැලකිය යුතු ප්‍රමාණයක් නැවත මෙරටට ගෙන්වා ගන්නා ලදී. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අනුව, 2020 අගෝස්තු මස වන විට සංක්‍රමණික ශ්‍රමිකයන් 39,489කට පමණ රැකියා අහිමි වී ඇති අතර, තවත් බොහෝ දෙනෙකු සිය ආදායම් පහළ යෑමකට මුහුණ දී තිබේ. මේ අතර, ඔක්තෝබර් මස ආරම්භය වන විට විදෙස් රටවල සිටින සංක්‍රමණික ශ්‍රමිකයන් 2,600කට පමණ කොවිඩ්-19 ආසාදනය වී ඇති අතර, 64 දෙනෙක් මිය ගොස් ඇත. ඒ අනුව, සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ රැකියා අහිමිවීම හා ඉපැයීම් අඩුවීම සහ සංචරණ සීමාවන් හා විශේෂයෙන් මැදපෙරදිග රටවලින් සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා වූ ඉල්ලුම අඩු වීම හේතුවෙන් සිදු වූ විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්වල අඩුවීම, මෙම වසර තුළ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ දේශීය ශ්‍රම වෙළඳපොළ කෙරෙහි බලපෑමක් ඇති කරනු ඇත.

- **ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් 2020 වසරේ පළමු භාගයේ දී කොවිඩ්-19 වසංගතයේ බලපෑම් සඳහා විසඳුම් ලෙස ගෙන ඇති විශේෂ පියවරවලට අමතරව, ශ්‍රම සංක්‍රමණ ක්‍රියාවලිය නියාමනය කිරීම සහ ශ්‍රම සංක්‍රමණිකයන් හා ඔවුන්ගේ පවුල් ආරක්ෂා කිරීම හා සවිබලගැන්වීම සඳහා වූ ක්‍රියාමාර්ග අඛණ්ඩව ගන්නා ලදී.** ඒ අනුව, ශ්‍රී ලංකාවේ සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා විශ්වසනීය විදේශ රැකියා අවස්ථා තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් 2020 වසරේ පළමු භාගයේ දී නීතිවිරෝධී බඳවාගැනීම්වලට අදාළව වැටලීම් 146ක් සිදු කළ අතර, විදේශ රැකියා ව්‍යාපාර තුළ නියුතු බලපත්‍ර රහිත පුද්ගලයන්ට සහ නීතිය උල්ලංඝනය කරන ලද බලපත්‍රලාභී නියෝජිතයන්ට එරෙහිව නඩු 58ක් ද ගොනු කරන ලදී. සුභසාධන සහ ආරක්ෂණ පියවර ලෙස, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් 2020 වසරේ පළමු භාගයේ දී සංක්‍රමණික ශ්‍රමිකයන් 40,143ක් වෙනුවෙන් රක්ෂණ වාරික ලෙස රුපියල් මිලියන 26.33ක් සහ නැවත මෙරටට ගෙන්වා ගැනීම, මරණ හිමිකම් සහ යැපෙන්නන් සඳහා වෛද්‍ය හිමිකම් ලෙස රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ පුද්ගලයන් 888ක් සඳහා රුපියල් මිලියන 54.86ක් ගෙවන ලදී. එමෙන්ම, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ ළමුන් 797ක් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 20.25ක් වැය කරන ලදී. තවද, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ඔවුන්ගේ සේවක සුභසාධක අරමුදල උපයෝගී කරගනිමින් අවශ්‍යතා සහිත සංක්‍රමණික ශ්‍රමිකයන් 38කට මූල්‍යාධාර සැපයීම සහ සේවක සුභසාධක අරමුදලෙන් රුපියල් මිලියන 0.22ක් හා රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ රුපියල් මිලියන 0.48ක් උපයෝගී කර ගනිමින් විදේශගතව සිටිය දී මුහුණ දුන් ගැටලු හේතුවෙන් සංක්‍රමණික ශ්‍රමිකයන් 15 දෙනෙකු නැවත මෙරටට ගෙන්වා ගැනීම සිදුකරන ලදී.

මේ අතර, දේශීය ශ්‍රමිකයන්ගේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා 2020 වසරේ පළමු භාගයේ දී රැකියා අපේක්ෂකයන් 1,293කට NVQ III මට්ටමේ සුදුසුකම් ලබා දෙන ලදී. කොවිඩ්-19 වසංගතයේ බලපෑම් සඳහා විසඳුම් ලෙස ගෙන ඇති විශේෂ පියවර ලෙස, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් පීඩාවට පත් සංක්‍රමණික ශ්‍රමිකයන්ගෙන් හා ඔවුන්ගේ පවුල්වලින් නිරන්තර තොරතුරු ලබා ගැනීම සඳහා විශේෂ තොරතුරු කවුළුවක් පිහිටුවීම සහ තොරතුරු හා රජයේ උපදෙස් ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය හරහා සංක්‍රමණික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් සමඟ බෙදා ගැනීම සිදු කරන ලදී. තවද, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් කොවිඩ්-19 ආසාදනය වී ප්‍රතිකාර ලබා ගන්නා, ස්වයං නිරෝධායනයට ලක් කර ඇති හෝ රැකියා අහිමි වූ හා ආහාර හෝ අත්‍යවශ්‍ය භාණ්ඩ ලබා ගැනීමට නොහැකි වූ සංක්‍රමණික ශ්‍රමිකයන්ට වියළි සලාක සැපයීම සඳහා අරමුදල් අවශ්‍ය වූ ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල සඳහා අරමුදල් වෙන් කරන ලදී. මීට අමතරව, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ජීවිත අහිමි වූ සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ පවුල්වල සාමාජිකයින්ට මූල්‍යාධාර සැපයීමට ද කටයුතු සිදු කරමින් පවතී.

### කම්කරු සබඳතා

- **පෞද්ගලික අංශයේ වැඩ වර්ජන සංඛ්‍යාව, වැඩ වර්ජන සඳහා සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව සහ වැඩ වර්ජන හේතුවෙන් අහිමි වූ මිනිස් දින ගණන පහළ යෑමත් සමඟ 2019 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2020 වසරේ පළමු භාගයේ දී කම්කරු සබඳතා වැඩිදියුණු විය.** කම්කරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත දත්තවලට අනුව, 2020 වසරේ පළමු භාගයේ දී වාර්තා වූ වැඩ වර්ජන සංඛ්‍යාව 15ක් වූ අතර, ඒ අතුරින් වැඩ වර්ජන 8ක් වැවිලි අංශයෙන් ද, වැඩ වර්ජන 7ක් වෙනත් පෞද්ගලික ආයතනවලින් ද වාර්තා වී ඇත. සමස්තයක් ලෙස 2020 වසරේ පළමු භාගයේ දී සේවකයන් 2,167ක් වැඩ වර්ජන සඳහා සම්බන්ධ වී ඇති අතර, ඔවුන්ගෙන් සියයට 50ක් වැවිලි අංශයේ ද ඉතිරි සියයට 50 වෙනත් පෞද්ගලික ආයතනවල ද විය. මෙම වැඩ වර්ජන හේතුවෙන් 2020 වසරේ පළමු භාගය තුළ දී සමස්ත මිනිස් දින 5,391ක් අහිමි වූ අතර, එයින් සියයට 67ක් වැවිලි අංශයේ ද, සියයට 33ක් වෙනත් පෞද්ගලික ආයතනවල ද විය. වැවිලි අංශයෙන් වාර්තා වූ වැඩ වර්ජන සංඛ්‍යාව 2019 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2020 වසරේ පළමු භාගයේ දී ඉහළ යන ලදී. කෙසේ වුවද, 2019 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2020 වසරේ පළමු භාගයේ දී වැඩ වර්ජන සඳහා සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව මෙන්ම වැඩ වර්ජන හේතුවෙන් අහිමි වූ මිනිස් දින ගණන ද පහළ ගිය අතර, මේ සඳහා කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය සමග පනවන ලද රට වසා දැමීම සහ සමාජ දුරස්ථභාවය පිළිබඳ සීමා හේතු වූවා විය හැකිය. වෙනත් පෞද්ගලික ආයතනවල වැඩවර්ජන සංඛ්‍යාව 2019 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2020 වසරේ පළමු භාගයේ දී පහළ යන ලදී. තවද, 2019 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2020 වසරේ පළමු භාගයේ දී වෙනත් පෞද්ගලික ආයතනවල වැඩ වර්ජන සඳහා සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව සහ වැඩ වර්ජන හේතුවෙන් අහිමි වූ මිනිස් දින ගණන පහළ යන ලදී.

- **2020 වසරේ පළමු භාගයේ දී නිපුණතා සංවර්ධන, රැකිරක්ෂා සහ කම්කරු සබඳතා අමාත්‍යාංශය[6] විසින් කාර්මික සමගිය වැඩිදියුණු කිරීම සඳහා පියවර කිහිපයක් ගෙන ඇත.** ඒ අනුව, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇති වූ සේවක ගැටලු විසඳීම මගින් අභියෝගාත්මක කාලය තුළ කාර්මික සමගිය පවත්වා ගෙන යෑම සඳහා අමාත්‍යාංශ මට්ටමේ කාර්යසාධක බලකායක් ස්ථාපනය කරන ලදී. මේ හරහා කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් වැඩ අත්හිටුවන ලද ආයතනවල සේවකයන් රඳවා ගැනීම සම්බන්ධයෙන්, සියලුම සේවකයන් සේවයට කැඳවිය නොහැකි අවස්ථාවල දී සියලුම සේවකයන්ට සමානුපාතිකව මාසික වැඩ ලබා දීම සඳහා සේවාමුර ක්‍රමයක් හෝ වෙනත් සුදුසු ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සහ 2020 මැයි, ජූනි, ජූලි, අගෝස්තු සහ සැප්තැම්බර් යන මාසවල සේවකයන්ට පැවරීමට ප්‍රමාණවත් වැඩ නොමැති අවස්ථාවල දී අවසන් වරට සේවකයන්ට ගෙවන ලද මුළු වැටුපට ඇතුළත් වූ මූලික වැටුපෙන් සියයට 50ක ප්‍රතිශතයක් හෝ රුපියල් 14,500ක් යන දෙකෙන් සේවකයන්ට වඩාත් වාසිදායක විකල්පයට අනුව වැටුප් ගෙවීම සම්බන්ධයෙන් එකඟතාවලට එළඹෙන ලදී. තවද, කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය හේතුවෙන් සිදු කරන ලද සේවක ඉවත් කිරීම සම්බන්ධ පැමිණිලි ලබා ගැනීම සහ විසඳීම කාර්යක්ෂමව හා ඵලදායීව සිදුකිරීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපිත කරන ලද අතර, සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල්, අධිභාර හෝ ප්‍රමාද ගාස්තුවලින් තොරව ගෙවීමට අමතර මාස හයක

6 2020 අගෝස්තු 09 වන දින සිට බලපැවැත්වෙන පරිදි අමාත්‍යාංශයේ නම කම්කරු අමාත්‍යාංශය ලෙස වෙනස් කර ඇත.

කාලයක් සේවායෝජකයන්ට ලබා දෙන ලදී. මේ අතර, රාත්‍රී වැඩමුර සඳහා කාන්තාවන් යොදා ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය අනුමැති ලබා දීම විධිමත් කෙරුණු අතර, රාත්‍රී වැඩමුර සඳහා අනුමැතිය ලබා දීමේ ක්‍රමවේදය වඩා කාර්යක්ෂම හා නම්‍යශීලී බවට පත් කිරීම සඳහා සේවායෝජකයන්ට රාත්‍රී වැඩමුර පවත්වාගෙන යාමට අවශ්‍ය ඉල්ලීම් අන්තර්ජාලය හරහා කම්කරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන ලදී. මීට අමතරව, 2020 වසරේ පළමු භාගයේ දී කම්කරු සබඳතා ක්ෂේත්‍රය තුළ නීති ප්‍රතිපාදන/සංශෝධන කිහිපයක් ද හඳුන්වා දෙන ලදී. ඒ අනුව, 2020 පෙබරවාරි මාසයේ දී පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මාසික අවම වැටුප රුපියල් 10,000 සිට රුපියල් 12,500 දක්වා ඉහළ දැමීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. තවද, සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් ගෙවීම් පැහැර හැරීම වැළැක්වීම සහ සේවක අයිතිවාසිකම් හා සේවක සුභසාධනය සුරක්ෂිත කිරීම සඳහා අලුතින් බඳවා ගත් සේවකයන් පිළිබඳ තොරතුරු මාස දෙකක් ඇතුළත කම්කරු දෙපාර්තමේන්තුවට වාර්තා කිරීම සේවායෝජකයන්ට අනිවාර්ය කරමින්, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සංශෝධනය කිරීමට පියවර ගන්නා ලදී. මීට අමතරව, 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදවීමේ පනත යටතේ වයස අවුරුදු 18ට අඩු තරුණ තරුණියන් සඳහා වන අන්තරාදායක රැකියාවන් පිළිබඳ කෙටුම්පත් රෙගුලාසි සහ සේවා නියුක්තිය සඳහා බලපාන අවම වයස අවුරුදු 14 සිට 16 දක්වා ඉහළ දැමීම සම්බන්ධයෙන් වන කෙටුම්පත් පනත් සංශෝධන ද කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

### ශ්‍රම ඵලදායිතාව

- **වැඩ කරන ලද පැයකට එකතු කළ අගය (2010 මිල අනුව) වශයෙන් මනිනු ලබන ශ්‍රම ඵලදායිතාව 2019 වසරේ පළමු කාර්තුවේ දී පැවති වැඩ කරන ලද පැයකට රුපියල් 491.06 සිට 2020 වසරේ පළමු කාර්තුවේ දී වැඩ කරන ලද පැයකට රුපියල් 564.77 දක්වා සියයට 15කින් ඉහළ යන ලදී.** 2019 වසරේ පළමු කාර්තුවට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුව තුළ දී සමස්ත ශ්‍රම ඵලදායිතාව වර්ධනය වීමට වැඩ කරන ලද පැය ගණනෙහි දක්නට ලැබුණු සැලකිය යුතු පහළ යෑම ප්‍රධාන වශයෙන් බලපාන ලදී. වැඩ කරන ලද පැය ගණනෙහි දක්නට ලැබුණු මෙම පහළ යෑමට කොවිඩ්-19 වසංගතයේ පැතිරීම පාලනය කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග හේතුවෙන් 2020 මාර්තු මාසයේ මැද සිට වැඩ කටයුතු සඳහා තිබූ සීමා හේතු විය හැකිය. 2019 වසරේ පළමු කාර්තුවට සාපේක්ෂව 2020 වසරේ පළමු කාර්තුවේ දී කර්මාන්ත සහ සේවා යන අංශ දෙකෙහිම ශ්‍රම ඵලදායිතාව ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කළ අතර, කෘෂිකර්මාන්ත අංශයේ ශ්‍රම ඵලදායිතාව පහළ යන ලදී. ශ්‍රම ඵලදායිතා මට්ටම අනුව, වැඩ කරන ලද පැයකට රුපියල් 701.04ක ඉහළම ශ්‍රම ඵලදායිතා මට්ටමක් වාර්තා කරමින් සේවා අංශය, ශ්‍රම සම්පත් වඩාත් කාර්යක්ෂමව භාවිතා කර ඇති බව පෙන්නුම් කළ අතර, කර්මාන්ත අංශයේ ශ්‍රම ඵලදායිතා මට්ටම වැඩ කරන ලද පැයකට රුපියල් 655.77ක් විය. මෑත කාලීනව දක්නට ලැබුණු ප්‍රවණතාවට අනුරූපව කෘෂිකර්මාන්ත අංශය 2020 වසරේ පළමු කාර්තුවේ දී ද වැඩ කරන ලද පැයකට රුපියල් 168.99ක අවම ශ්‍රම ඵලදායිතා මට්ටමක් වාර්තා කරන ලදී.

## අපේක්ෂිත වර්ධන

### මිල

- **2020 වසරේ ඉදිරි කාලය තුළ දී උද්ධමනය එහි ඉලක්කගත පරාසය වන සියයට 4-6 තුළ රඳා පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.** මනාව පාලනය වී ඇති උද්ධමන අපේක්ෂාවන්, ඉල්ලුම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ හිතකර දේශීය සැපයුම් තත්ත්ව, උද්ධමනය හිතකර මට්ටම්හි පවත්වා ගැනීමට දායකත්වය සපයනු ඇත. කෙසේ වුවද, ආහාර කාණ්ඩයේ උද්ධමනයේ තාවකාලික ඉහළ යෑමක් ඇති කරමින්, නිතර මිල උච්චාවචනය වන ආහාර අයිතම අතරින් විශේෂයෙන්ම එළවළු, පළතුරු සහ නැවුම් මත්ස්‍ය ආදියෙහි සැපයුමේ බිඳවැටීම් කෙරෙහි, වසරේ අග භාගය තුළ අපේක්ෂිත ඍතුමය තද වැසි හේතු විය හැකිය. තවද, ජාත්‍යන්තර වෙළඳපොළේ ආහාර මිල ගණන් පහළ යෑමේ ප්‍රවණතාව වෙනස්වීමට ඇති හැකියාවක් පවතින වාතාවරණයක් තුළ, දේශීය මුදල තවදුරටත් අවප්‍රමාණය වීමක් සිදු වුවහොත් ආනයනික අයිතමවල මිල ඉහළ යෑමක් ඉදිරියේ දී අපේක්ෂා කළ හැකිය. එමෙන්ම, මෙවැනි ප්‍රවණතා යටතේ, කොවිඩ්-19 වසංගත ව්‍යාප්තියත් සමඟ පනවන ලද ආනයන සීමා ලිහිල් කිරීමක් සිදු වුවහොත් ආනයනික අයිතමවල මිල විචලන තුළින් හට ගන්නා උද්ධමනයේ කැපී පෙනෙන වර්ධනයක් සිදු වනු ඇත.

- **සැපයුම් අංශයේ විචලන තුළින් ආහාර මිල ස්ථායිතාව නිරන්තරයෙන් අභියෝගයට ලක් කෙරෙන අතර, මේ තුළින් ස්ථාවර සැපයුම් කළමනාකරණ පද්ධතියක් සඳහා වන අවශ්‍යතාව මනාව ඉස්මතු කෙරෙයි.** බෝග නිෂ්පාදනයේ ඇති විය හැකි අතිරික්ත හා හිඟ තත්ත්ව පුරෝකථනය කිරීමට මෙන්ම, එම අපේක්ෂිත හිඟ මට්ටම්වලට අනුව, බෝග නිෂ්පාදනය කිරීමට ගොවීන්ට මඟපෙන්වීම සඳහා යෝග්‍ය යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම අවශ්‍ය වේ. ඒ අනුව, හඳුනා ගත් හිඟ බෝග වගා කිරීම සඳහා දිරිගැන්වීම් ලබා දීමට සහ අතිරික්ත බෝග නිෂ්පාදන මිලදී ගැනීම සඳහා මැදිහත්වීම් කිරීමට රජයට හැකි වනු ඇත. එමෙන්ම, රජය විසින් අතිරික්ත සැපයුම ගබඩා කළ හැකි යෝග්‍ය බෝග ගබඩා පහසුකම් ස්ථාපනය කළ යුතු අතර, ඒ සමඟම, රෝහල්, බන්ධනාගාර හෝ පෞද්ගලික අංශයේ වෙළෙඳුන් වැනි අවශ්‍යතා ඇති ආයතන සඳහා තරඟකාරී මිලකට අතිරික්ත සැපයුම අලෙවි කිරීමට සුදුසු යාන්ත්‍රණයක් ද සකස් කළ යුතුය. කෘෂිකාර්මික අංශය ආර්ථිකය තුළ පහළම ශ්‍රම ඵලදායිතා මට්ටම පෙන්නුම් කරන බැවින්, එය නිෂ්පාදන පිරිවැය මෙන්ම මිල ඉහළ නැංවීමට ද දායක වේ. එහෙයින්, කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟම පැන වූ ආනයන සීමා හේතුවෙන් ඇති වූ අවස්ථාවන්ගෙන් ඵල නෙලා ගැනීම සඳහා, රජය විසින් නිෂ්පාදනය ඉහළ නංවන අතරම, නිෂ්පාදන පිරිවැය සහ පසු අස්වනු හානි අවම කිරීම සඳහා මෙම අංශයේ ඵලදායිතාව වැඩිදියුණු කිරීමට ද සුදුසු යාන්ත්‍රණ ක්‍රියාත්මක කළ යුතුය.

## ශ්‍රම බලකාය, සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය

- **විශේෂයෙන් මැදපෙරදිග රටවල සංක්‍රමණික ශ්‍රමිකයන් අඩු කිරීමේ යෝජනාවලට සමගාමීව සංක්‍රමණික ශ්‍රමය සඳහා වන ඉල්ලුම පහළ යෑම, නව විදේශ රැකියා අවස්ථා සෙවීමේ අවශ්‍යතාව මතු කරයි.** කොවිඩ්-19 වසංගතයේ බලපෑම නිසා ඉන්ධන සඳහා වන ගෝලීය ඉල්ලුම පහළ යෑම හේතුවෙන් ඉන්ධන මිල පහළ යෑම නිසා ශ්‍රී ලංකාවේ විදේශ ශ්‍රමිකයන්ට ප්‍රධාන සත්කාරක රටවල සිදු වූ රැකියා අහිමි වීම් සහ වැටුප් කප්පාදු කිරීම් මධ්‍යයේ සත්කාරක රටවල සංචාරක සීමා පැනවීමත් සමඟ විදේශ සේවා නියුක්තිය සැලකිය යුතු තර්ජනයකට ලක්ව ඇති අතර, එය විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලට ද සැලකිය යුතු බලපෑම් ඇති කරයි. ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළේ වඩාත්ම අවදානමට ලක් වන කාණ්ඩය, සංක්‍රමණික ශ්‍රමිකයන් වන හෙයින් මෙම ප්‍රවණතාව අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. මෙහි දී, රැකියා අහිමි වූ සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා කෙටිකාලීනව තාවකාලික ජීවනෝපාය ආධාරයක් අවශ්‍ය වේ. දීර්ඝකාලීනව, ශ්‍රම බලකායට එකතු වූ නැවත පැමිණි සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ අවශ්‍යතාව අනුව කුසලතා වැඩිදියුණු කිරීම හෝ වෙනත් කුසලතා ලබා දීම මගින් මෙරට හෝ වෙනත් රටක නැවත සේවයේ යෙදවීම මෙන්ම, ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළේ මෙවැනි අනාගත කම්පනවලට මුහුණ දීම සඳහා අවශ්‍ය සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ස්ථාපනය කිරීම ද සිදු කළ යුතුය. තවද, වසංගත කාලසීමාව තුළ විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් අත්හිටුවීම නිසා අහිමි වූ විදේශ රැකියා අවස්ථා නැවත ලබා ගැනීම සඳහා සාකච්ඡා පැවැත්විය යුතුය. මීට අමතරව, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ රට තුළට ගලා ඒම යථා තත්ත්වයට පත් කිරීමට සහ ස්ථාවර මට්ටමක පවත්වාගෙන යෑමට පුහුණු සහ ආරක්ෂිත සංක්‍රමණ අවස්ථා ප්‍රවර්ධනය කරමින් විදේශ රැකියා අවස්ථා සඳහා නව වෙළඳපොළවල් අඛණ්ඩව ගවේෂණය කළ යුතුය.

- **සමාගම් ව්‍යුහවල සහ රැකියාවල නියැලීමේ ක්‍රමවේදවල සිදුව ඇති විශාල වෙනස්කම්වලට සහ වසංගත වැනි තත්ත්ව සඳහා මුහුණදීමට හැකි වන පරිදි ශ්‍රී ලංකාවේ දැනට පවතින කම්කරු නීති නැවත සලකා බැලීම අවශ්‍ය වේ.** සෞඛ්‍ය අවදානම් සහ කොවිඩ්-19 වසංගතය පැතිරීම පාලනය කිරීමට රජය විසින් පනවන ලද සීමා හේතුවෙන් බිඳවැටුණු ව්‍යාපාරික ක්‍රියාකාරකම් සමඟ ඇති වූ වැටුප් ගෙවීම් සහ සේවයෙන් ඉවත් කිරීම් සම්බන්ධ ගැටලු විසඳීමට අවශ්‍ය කම්කරු නීති නොමැති පසුබිමක, ශ්‍රී ලංකා හාම්පුතුන්ගේ සංගමය, වෘත්තීය සමිති සහ නිපුණතා සංවර්ධන, රැකියා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය, සේවයෙහි නියුක්ත වන ප්‍රමාණයට සමානුපාතිකව වැටුප් ගෙවීමට අදාළව ත්‍රෛපාර්ශ්වික ගිවිසුමකට එළඹුණි. මෙවැනි පාලනය කළ නොහැකි අවස්ථාවල සේවායෝජකයන්ට සහන සැපයීම මෙන්ම, සේවකයන් සඳහා විරැකියා ප්‍රතිලාභ ඇතුළත් සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ලබා දීම, නිපුණතා ඉහළ නැංවීම හෝ වෙනත් නිපුණතා සඳහා නැවත පුහුණු කිරීම සහ රැකියා අහිමි වූ සේවකයන් සඳහා නැවත රැකියා ලබා දීම සඳහා ඉදිරියේ දී මෙම තීරණ නීතිගත කළ යුතු මෙන්ම, පවත්නා නීති නැවත සලකා බැලිය යුතුය. ඒ අනුව, ශ්‍රී ලංකාවේ කම්කරු නීතිවල පවතින දෘඪතාවය විදේශ ආයෝජන අවස්ථා අහිමි වීමට එක් හේතුවක් වන බැවින්, සේවායෝජකයන්ට සිය සේවකයන්

කළමනාකරණය කිරීමේ දී නම්‍යශීලීව කටයුතු කිරීම සඳහා පවත්නා කම්කරු නීති සංශෝධනය කළ යුතුය. මීට අමතරව, වසංගත කාලයේ සමාගම් විසින් නිවසේ සිට වැඩ කිරීම, අර්ධකාලීන වැඩ කිරීම සහ නම්‍යශීලී වැඩ කරන වේලාවන් වැනි වැඩ කිරීමේ ක්‍රමවේදවල සිදු විය යුතු වෙනස්කම්වලට අනුගත වූ අතර, එම ක්‍රමවේද පශ්චාත් වසංගත සමයේ දී ද අඛණ්ඩව පවත්වාගෙන යනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. ඒ අනුව, නව ව්‍යාපාර ආකෘතීන් සහ වැඩ කිරීමේ ක්‍රමවේදවලට අනුකූලව පවත්නා කම්කරු නීති නවීකරණය කළ යුතුය. මෙම සංශෝධන, පුරුෂයන් හා සැසඳීමේ දී සැලකිය යුතු අඩු මට්ටමක පවතින ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්වය ද ඉහළ නංවනු ඇත.

- **අවිධිමත් අංශය ඉලක්ක කරගත් සමාජ ආරක්ෂණ පියවරවල වැදගත්කම වසංගත කාලපරිච්ඡේදය තුළ ඉස්මතු විය.** දැඩි කම්කරු නීති මධ්‍යයේ විරැකියා ප්‍රතිලාභ යෝජනා ක්‍රම නොමැති තත්ත්වයක ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායෙන් බහුතරයක් අවිධිමත් රැකියාවලට ආකර්ෂණය වේ. ඒ අනුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද 2019 ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව, ශ්‍රී ලංකාවේ සමස්ත සේවා නියුක්තියෙන් විශාල කොටසක්, එනම් සියයට 57.4ක්, අවිධිමත් අංශයේ සේවා නියුක්තිකයන් වේ. කොවිඩ්-19 වසංගතයේ පැතිරීම පාලනය කිරීමට ගත් ක්‍රියාමාර්ග මධ්‍යයේ ජීවනෝපායක් සොයා ගැනීමට දැඩි ලෙස බාධා ඇති වීම හේතුවෙන් ශ්‍රම බලකායේ වඩාත්ම බලපෑමට ලක් වූ කාණ්ඩය අවිධිමත් අංශය වේ. අවිධිමත් අංශයේ සේවා නියුක්තිය කිසිදු සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයකින් ආවරණය නොවන හෙයින්, අර්බුදකාරී අවස්ථාවල දී ඔවුන් දරිද්‍රතා රේඛාවෙන් පහළට වැටීමේ වඩාත් අවදානමට ලක්වන ශ්‍රම බලකා කාණ්ඩය වේ. එම නිසා, අවිධිමත් අංශයේ සේවකයන්ගේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා සිදු කළ යුත්තේ රටේ විශාලතම ශ්‍රම බලකා කාණ්ඩය වන අවිධිමත් අංශය ඉලක්ක කරගත් සමාජ ආරක්ෂණ පියවර ක්‍රියාවට නැංවීමයි.

- **රටේ ආර්ථික වර්ධනයට සාධනීය ලෙස දායක විය හැකි අනාගත අභියෝගවලට මුහුණදීමට සූදානම් ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉතා වැදගත් වේ.** අඛණ්ඩව ඉස්මතු කර ඇති පරිදි ශ්‍රම වෙළඳපොළේ ඉල්ලුම සහ සැපයුම අතර ඇති පරතරය සපුරාලීම සඳහා මෙන්ම, දේශීය ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් කිරීම සඳහා, ශ්‍රම වෙළඳපොලේ ඉල්ලුමට සරිලන පරිදි ශ්‍රම බලකායේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමට ප්‍රාථමික, ද්විතීයික, උසස් සහ වෘත්තීය අධ්‍යාපනයට අදාළ ප්‍රතිසංස්කරණ සිදු කිරීම අත්‍යවශ්‍ය වේ. කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟ ගෝලීය සැපයුම් දාමවල සිදු වූ බිඳවැටීම, කුසලතා පූර්ණ දේශීය ශ්‍රම බලකායක දායකත්වය තුළින් දේශීය ආර්ථිකය නංවාලන ප්‍රතිපත්ති සම්පාදනයේ අවශ්‍යතාව යළිත් වරක් මතු කරන ලදී. එමෙන්ම, 2021 වසරේ සිට 2030 වසර දක්වා කාලය "නිපුණතා සංවර්ධන දශකය" ලෙස රජය විසින් ප්‍රකාශයට පත් කිරීමත් සමඟ, විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම, ජීවන තත්ත්වය හා දේශීය නිෂ්පාදන වැඩිදියුණු කිරීම, පුහුණු සංක්‍රමණ ප්‍රවර්ධනය සහ නුපුහුණු ශ්‍රමය හා ශ්‍රම ආනයනය අඩු කිරීම සඳහා අධ්‍යාපන ක්‍රමයේ අපේක්ෂිත ප්‍රතිසංස්කරණ වැදගත් වේ. තවද, ශ්‍රී ලංකාව තුළ අනාගත අභියෝගවලට මුහුණදීමට සූදානම් ශ්‍රම බලකායක් ගොඩනැගීම සඳහා අධ්‍යාපන ක්‍රමයේ ධාරිතාවය පුළුල් කිරීමට රට වසා තබන ලද කාලය අතරතුර භාවිත කරන ලද මංගත පද්ධති (online platforms) අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම හා පුළුල් කිරීම සහ පෞද්ගලික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම වැදගත් වේ.

4